# විද්‍යාව සහ ජාතික ආරක්ෂාව

එම්. අසෝක ටී. ද සිල්වා

## පසුබිම

පසුගිය සියවස් දෙක තුළ දී ලෝකයෙහි සිදුවූ වෙනස්කම් ස්ථාපනය කළ නිදහස් වෙළඳපොළ අනුගමනය කිරීමට මුල් වූ රටවල් හී අන්‍යෝන්‍යයක්තතාවයෙන් යුත් (එකිනෙකින් බැඳුණු) තාක්ෂණික දියුණුව, අපනයන මත පදනම් වූ ආර්ථික වර්ධනය සහ පාරිභෝගිකත්වය, වර්තමානයේ දී දක්වන ආපසු යොමුවීමේ සංසිද්ධිය, ලෝක සහ ජාතික යන දෙමට්ටමෙහිම ආරක්ෂාව පිළිබඳ සිත් යොමු කිරීමට සලස්වා ඇත.

එක්සත් ජාතීන්ගේ අධ්‍යන වාර්තාවක් පෙන්වා දෙනුයේ වර්ෂ 1950-2000 අතර කාලය තුළ දී ලෝක ආර්ථිකය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 5 සිට ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 30 දක්වා ඉහළ ගිය බවය. එසේම, වර්ෂ 2000 දී දිනකට ඇමරිකානු ඩොලර් 1-2කින් ජීවත් වූ බිලියන 2ක් වූ ජනතාව ගේ සංඛ්‍යාව වර්ෂ 2025 වන විට බිලියන 4ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. මෙයට අමතරව වර්ෂ 2050 වන විට ලෝක ජනගහනයට තවත් අතිරේක බිලියන 3ක ජනතාවක් එක්වනු ඇත්තේ ආහාර, ජලය, සනීපාරක්ෂාව, නිවාස සහ බලශක්තිය ආදී මූලික අවශ්‍යතා කෙරෙහි පවත්නා පීඩනය ඉහළ නංවාලමින් සහ වර්ධන සංසිද්ධියට සහායවීමට පවතින ස්වාභාවික සම්පත් ශීඝ්‍ර ක්ෂය වීමට ලක්කරමිනි. වාර්තා දක්වන අන්දමට රටවල් 29ක මිලියන 450ක ජනතාවක් ජලය-හිඟ ප්‍රදේශවල ජීවත් වන අතර, ලෝක ජනගහනයෙන් අඩකට, ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැත. එසේම ලෝක ජනගහනය වයස්ගත වෙමින් සිටින අතර නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වෙමින් සිටිති. ඇස්තමේන්තුවලට අනුව වර්ෂ 2050 වන විට ලෝකයේ වෙසෙන වයස්ගත ජනගහනය, එහි වෙසෙන දරුවන්ගේ සංඛ්‍යාව ඉක්මවනු ඇත. කාර්මික ලෝකය වයස්ගතවීමට පෙර පොහොසත් වුවද, සංවර්ධනය වන ලෝකය පොහොසත් වීමට පළමු වයස්ගතවීමේ පරස්පර ඉරණමට ලක්ව සිටින්නේ කවර හේතුවක් නිසාද යන්න තේරුම් ගැනීම අසීරුය.



දිරිගන්වන සුළු විවිධත්වයක් සහ සාරධර්ම හවුල්ව භුක්තිවිඳීමේ ලෝක ප්‍රවණතාවයක් මතුවෙමින් පැවතුන ද සාමූහික වගකීම සහ ගෝලීය සාරධර්ම පිළිබඳ හැඟීමක් නොමැතිකම මානව වර්ගයාගේ අභිවෘද්ධිය සඳහා වන සදාචාරාත්මක බලවේග එකට බැඳීමක් ඇති කිරීමට අසමත් වී ඇත. මෙවැනි සන්දර්භයක් තුළ ශ්‍රී ලංකාව වැනි ඌන සංවර්ධිත රටවල් කෙරෙහි මෙකී ගෝලීය ආර්ථික අවරෝහණයේ කටුක බලපෑම අල්පතර වීම විශාල සහනයක් බව කිව යුතුය.

ඒ කෙසේ වෙතත්, ජාතික ආරක්ෂාව පිළිබඳ සැලකීම මෙම ගෝලීය ආර්ථික පසුබෑමේ උරුමය ඉස්මතු වෙයි. ජාතික ගැටළුවල සමහර පාර්ශ්ව ගෝලීය ආර්ථික කැලඹීම්වල බලපෑම්වලට යටත් වුව ද ජාතික ආරක්ෂාව පිළිබඳ සැලකුවිට එය බොහෝ දුරට එම රටවලට විශේෂිත වෙයි. එනිසාම එය අභ්‍යන්තර විසඳුම් අවශ්‍ය වන කරුණක් බව වටහා ගත යුතුය. 'ජාතික ආරක්ෂාව' යන්න ජාතියේ ස්වාධීනත්වය, ස්වාධිපත්‍යය සහ භෞමික අඛණ්ඩතාවය සුරැකීම යනාදියට සීමා නොවිය යුතු අතර, දුප්පත්කම, සමාජ සාධාරණත්වය, අයුක්තිය, අසමානතාවය, ප්‍රමාණවත් තරම් ආහාර සුලබ බව, පිරිසිදු ජලය, සෞඛ්‍යය, නිරුපද්‍රිත නිවාස, සනීපාරක්ෂාව සහ බලශක්තිය ආදිය පවත්නා බව වැනි සංවර්ධන අභියෝග පිළිබඳ සැලකිල්ල යොමු කිරීම ද ඒ හා සමානව වැදගත් වේ. මීට අමතරව 2001 වසරේ සිදු කරන ලද එක්සත් ජාතීන්ගේ අධ්‍යයනයෙන් හඳුනාගත් පරිදි ''ජීවිතයට රැකුලක් වීම සඳහා පරිසරයේ ස්වශක්තතාවය'' යනුවෙන් අරුත් ගැන්වෙන ''පාරිසරික ආරක්ෂාව'' යන්න තුළ මානව වර්ගයාගේ සමස්ත ආරක්ෂණ තර්ජනය කුමක්ද යන්න අන්තර්ගතවේ.

ගංවතුර, සුළි සුළං, නායයෑම්, කුණාටු රළ පහර, නියඟ වෙරළ ඛාදනය, ලවණතාවය, මුහුදු ඛාදනය, අකුණු, වනාන්තර ගිනිගැනීම් සහ කර්මාන්ත ආශ්‍රිත ව්‍යසන යනාදිය මගින් ඇතිවන්නාවූ කාලගුණය හා සම්බන්ධ ස්වභාවික සහ මානව-කාරක ව්‍යසන මගින් ද ජාතික ආරක්ෂාවට තර්ජන ඇති විය හැක. ඊට අමතරව ඕසෝන් ස්තරය ක්ෂය වීම, වායු

ගෝලීය උෂ්ණත්වය සහ මුහුදු ජල මට්ටම ඉහළ යෑම, යුද්ධ අවස්ථාවන්හී දී සිදුවන පාරිසරික වෙනස්කම්. කාන්තාරකරණය, ජෛව විවිධත්වය විනාශ වීම, කර්මාන්ත සහ රථවාහන වලින් සිදුවන්නාවූ විමෝචන කරණ කොට ගෙන සිදු වන්නාවූ වායු දූෂණය, තෙල් වැගිරීම්, විකිරණශීලී ද්‍රව්‍ය හේතුකොටගෙන ඇති වන හදිසි අනතුරු, සහ කෘත්‍රිම ප්‍රවේණික දූෂණය, යනාදී සංසිද්ධි පරිසරයේ ස්වශක්තතාවයට අභියෝග කිරීම පිණිස එකට කඳවුරු බැඳ ඇත. මෙවන් තර්ජන දේශගුණ විපර්යාස ක්‍රියාවලියට හේතු වී ඇති, පාලනය කළ නොහැකි සහ කුළුගැන්වීමේ සුදුසු නොවන සංවර්ධන කටයුතු හා සමග සෘජුවම හෝ වක්‍රව හෝ බැඳී ඇත.



ජලයෙන් 96%ක්ම භාවිත කෙරේ. මුළු පරිමාව ඝන මිලි මීටර 118,000-131,320ක පරාසයකින් ජල පරිමාවක් එකතු කරමින් ශ්‍රී ලංකාවට මි. මී. 1,800-2,000ක විචල්‍යතාවයකින් යුත් වර්ෂාපතනයක් ලැබෙන බව ඇස්තමේන්තු කර ඇත. අපවහන බේසම් 70කින් (මුළු ගණන 103කි) ලබාගත් මිණුම්වලට අනුව තෙත් කලාපයට වසරකට මි. මී. 900-1550ක් සහ වියළි කලාපයට මි. මී. 1200-1550ක් ලෙස වාෂ්පී උත්ස්වේදනය වාර්තාවී ඇති අතර මෙමගින් ශ්‍රී ලංකාවේ දේශගුණ කලාප තුළ ජල අතිරික්තයක් සහ ජල හිඟයක් යන දෙකම පවතින බව පෙන්නුම් කෙරේ.



වසර 1850 සිට උණුසුම්ම වසර දොළහ තුළට පසුගිය අවුරුදු 12 (1995-2006) න් 11 ක්ම ඇතුළත් වන බව නිරීක්ෂණය කරනු ලැබ ඇති අතර ගෝලීය සාමාන්‍ය මුහුදු මට්ටම 1961 සිට වසරකට මි. මී. 1.8ක සාමාන්‍ය වේගයකින් ද 1993 සිට වසරකට මි. මී. 3.1ක වේගයකින් ද ඉහළ නැග ඇති බවත් දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්-රාජ්‍ය සංසදය (IPCC) තම සිව්වැනි තක්සේරු වාර්තාවෙන් (2007) පෙන්වා දී ඇත. ආහාර නිෂ්පාදනය, ජල සුලබතාවය, සෞඛ්‍යමය අවදානම් තත්ව සහ රෝගවල පැවැත්ම මෙන්ම බලශක්ති ඉල්ලුම යනාදියට දේශගුණ විපර්යාස බලපාන්නේ කෙසේද යන්න පිළිබඳවද මෙම වාර්තාව මගින් පෙරයීමක් සිදු කර ඇත. ''අනුහුරුවීම සඳහා අඩුම හැකියාවක් සහිත වීම නිසා දේශගුණ විපර්යාස කරණ කොටගෙන ඇති වන බලපෑම් වලට වඩාත්ම පාත්‍ර වන්නේ දුප්පත් මිනිසුන් සහ දුප්පත් රටවල්ය'' යන අනතුරු හැඟවීම මෙම වාර්තාව මගින් සිදු කර ඇත. මෙම කරුණු පසුබිමෙහි තබාගෙන, ශ්‍රී ලංකාවේ 'ජාතික ආරක්ෂාව' පිළිබඳ අවධානය යොමු කරමු.

## ජල සුරක්ෂිතතාවය

ජල සුරක්ෂිතතාවය යනුවෙන් හැඳින්වෙන්නේ පිළිගතහැකි තත්වයකට ආහාර සහ භාණ්ඩ නිෂ්පාදනය සහ ජලය පරිභෝජනය කරන සියල්ලන්ගේ සනීපාරක්ෂාව තහවුරු කිරීම, සෞඛ්‍යමත් ජීවිතයක් සහ සෞභාග්‍යය සහතික කිරීම යනාදිය සඳහා සාධාරණ ලෙස ජල ව්‍යාප්තිය සිදු කිරීම සහ ලාභ මෙන්ම පිරිසිදු ජලය සුලබ වීමයි. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට 16%කින් පමණක් දායක වන කාෂිකර්මාන්තයට සහ ආහාර නිෂ්පාදනයට ජල චක්‍රයේ ලබාගත හැකි

ජල සුරක්ෂිතතාවය ගැන සැලකීමේදී රාජ්‍ය ආයතනවලට දැඩි පීඩනයක් එල්ල කළ මෑත අතීතයේ දී සිදුවුණු අනපේක්ෂිත සිද්ධි දෙකක් සිහිපත් කළ හැකිය. පළමුවැන්න නම් දකුණු, නිරිතදිග සහ නැගෙනහිර වෙරළබඩ තීරය මුහුදු දියෙන් යටපත් කරමින් පානීය ළිං 50,000ක් පමණ දූෂණයට ලක් කළ සහ එම ප්‍රදේශවල වාසය කළ 500,000ක පමණ ජනතාවක් පීඩාවට පත් කෙරුණු ඉන්දීය සාගර සුනාමියයි. දෙවැන්න නම් ගොවීනට වාරිජලය අහිමි කර අක්කර 30,000ක පමණ වී අස්වැන්නක් විනාශ කරමින් සිවිල් යුධ තත්වයක දී ජලය ආයුධයක් ලෙස භාවිත කළ නැගෙනහිර පළාතේ මාවිල් ආරු සිද්ධියයි.

කෙසේ වෙතත් දැඩි ජල හිඟයකට මුහුණ නොදෙන දකුණු ආසියාතික රටවල් අතරින් එකක් ලෙස ශ්‍රී ලංකාවට ද යම් වරප්‍රසාදයක් උරුම වුව ද ජල සංරක්ෂණය සඳහා උචිත ක්‍රමවේද යොදා නොගෙන තිබෙන තත්වය පිළිබඳ සැහීමට පත්වීම සහ ඒ පිළිබඳ අධිතක්සේරුවක පිහිටා කටයුතු කිරීම ඉදිරි දශක කිහිපය තුළ අපගේ අවගමනය ඉක්මන්

කිරීමට හේතුවක් වනු ඇත. එහෙයින්, ශ්‍රී ලංකාව ජල හිඟ යකින් පෙළෙන රටක් බවට පත් නොවීම සඳහා විශේෂිත ක්‍රමෝපායයන් සහ වැසි ජලය රැස් කිරීම, සංචිත කිරීම සහ සංරක්ෂණය, ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය, ලවණ ඉවත් කිරීම, වාරි ජල කාර්යක්ෂමතාවය වැඩි කිරීම, නියං ප්‍රතිරෝධී සහ ජලපරිභෝජනය අඩු ආහාර සහ වාණිජ බෝග වැඩි දියුණු කිරීම, ගංගා නිම්න හා ජල පෝෂක ප්‍රදේශ රැක ගැනීම, සහ අවසාන වශයෙන් සමෝධානිත වාරි ජල සම්පත් කළමනාකරණය සුරක්ෂිත කිරීම සඳහා සැලසුම් කිරීම යනාදිය නිර්දේශ කර ඇත. ඒ හැරුණු කොට භූගත ජලයේ ෆ්ලූවොරයිඩ ඉහළ මට්ටම, සහ අනෙකුත් අපවිත්‍රකාරක වැනි දෑ සඳහා කඩිනම් ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග අවශ්‍යවේ. වසර 2015 සඳහා එක්සත්ජාතීන්ගේ සහස්‍ර සංවර්ධන ඉලක්ක (MDG) මගින් සකසනු ලැබූ සුරක්ෂිත පානීය ජලය සහ මූලික සනීපාරක්ෂාව (UNDP MDG රාෂ්ට්‍ර වාර්තාව, 2005) යනාදිය හා සම්බන්ධව ඉලක්ක ළඟා කරගැනීමට අවශ්‍ය කෙරෙන මාර්ගයට ශ්‍රී ලංකාව පිවිස තිබීම මහත් භාග්‍යයකි.

වෙනස්වන භූ විද්‍යාත්මක තත්වයන්ට සහ භූ තල චලනවලට අනුව ජල විදුලිබල නිෂ්පාදනයට ඉවහල් වන්නා වූ ජලාශවල වේලි, සහ වැව් යනාදියෙහි ආරක්ෂාව, ලවණ ඇතුළුවීමට එදිරිව ප්‍රධාන ජල ඇතුළත් කිරීම් සහ පොම්ප කිරීමේ මධ්‍යස්ථාන (කැලණි ගඟෙහි පිහිටා ඇති අඹතලේ ජලාශය වැනි මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීම, සහ වියළි කලාපීය ජලාශ සහ ඇලමාර්ග පද්ධතිය ආරක්ෂා කිරීම යනාදිය ද ජල සුරක්ෂිතතාවය ලෙස සැලකිය හැකි වේ. ඉහත සඳහන් සිද්ධීන් වලට ප්‍රමාණවත් පූර්ව අනතුරු හැඟවීමේ පද්ධති නොමැති අතර එනිසාම ස්වභාවික, මානව සහ ත්‍රස්තවාදී ක්‍රියා හේතු කොට ගෙන ඇතිවිය හැකි ව්‍යසන යනාදිය සුපිරි මට්ටමේ නඩත්තු ක්‍රියාවලියක සහ නිරන්තර සුපරීක්ෂාවෙහි ඇති වැදගත්කම අවධාරණය කරයි. ජලාශ 32ක වේලිවල ආරක්ෂාව සහ පාත්‍රීතාවය පිළිබඳ 2000 වසරේ දී සිදුකරනු ලැබූ අධ්‍යයනයක් මගින් ඉන් වේලි 04ක් ඉහළ අවදානම් තත්වයකද වේලි 10ක් මධ්‍යස්ථ අවදානම් මට්ටමක ද ඉතිරි සියල්ල අවදානම් තත්ව දරා සිටීම සඳහා දැඩි ලෙස නඩත්තු කළ යුතු බවද පෙන්වා දී තිබේ. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියෙහි තාක්ෂණ සහයෝගය ඇතිව මෙරට පරමාණුක බලශක්ති අධිකාරිය තුළ පිහිටවනු ලැබූ ට්‍රිටියම් පර්යේෂණාගාරය, සමනළ වැව, වික්ටෝරියා, රන්දෙණිගල සහ කුකුලේගඟ යන ව්‍යාපෘතිවල සිදුවිය හැකි දියකාන්දුවීම්, වැස්සීම් සහ අවසාදිත තැන්පත්වීමේ වේගය යනාදිය අනාවරණය කරගැනීමේ දී ප්‍රයෝජනවත් වන බව දැනටමත් පෙනී ගොස් තිබේ.

## දරිද්‍රතාවය සහ කුසගින්නෙන් හා මන්දපෝෂණයෙන් නිදහස් වීම

වත්මනෙහි වඩාත්ම අවධානයට යොමු වී ඇති සුරක්ෂිතතා සැලකිල්ල ලෙස දරිද්‍රතාවය සහ මන්දපෝෂණයෙන් නිදහස්වීම හැඳින්විය හැක. කුසගින්න ශ්‍රී ලංකාව හා සම්බන්ධයෙන් ගත් කළ බරපතල ගැටළුවක් නොවේ. 1993 දී 37.7% ක්වූ වයස අවු. 5ට අඩු, බර අඩු දරුවන්ගේ සංඛ්‍යාව (නිගමනය සඳහා වන දර්ශකයකි) ශීඝ්‍රයෙන් අඩු වී වර්ෂ 2015 වන විට 12% ටත් වඩා අඩු වෙතැයි අපේක්ෂිතය. එය සහස්‍රක සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයටත් වඩා අඩුය. කෙසේවෙතත්, මන්දපෝෂණය බරපතළ ගැටළුවක් ලෙස ඉතිරිව පවතී. අපේ රටේ ''ජාතික දරිද්‍රතා රේඛාවට'' පහළින් සිටින ජනසංඛ්‍යාව 1990 දී 26.1% සිට 2002 දී 22.7% දක්වා අඩුවී ඇති අතර ආහාර ශක්ති පරිභෝජන අවම මට්ටමට වඩා පහළින් සිටින ජනසංඛ්‍යාව 1990 දී 50.9% සිට 2002 වසරේ දී 51.3% දක්වා ඉහළ ගොස් ඇත. සහස්‍ර සංවර්ධන දර්ශක පිළිබඳ 2005 වසරේ දී එ. ජා. සංවර්ධන වැඩසටහන මගින් ඉදිරිපත් කෙරුණු රාෂ්ට්‍ර වාර්තාවට අනුව දරිද්‍රතාවය අඩු කිරීම සහ මන්දපෝෂණය පිළිබඳ 2015 දක්වා සකසන ලද ඉලක්ක ශ්‍රී ලංකාවට සපුරාගැනීමට නොහැකි තත්වයක් පෙනෙන්නට තිබේ.

දකුණු ආසියාවේ වඩාත් පෘථුල සමාජ ආරක්ෂණ පද්ධතියක් සහිත රටක් ලෙස ශ්‍රී ලංකාව මුළු ලෝකය පුරාම ප්‍රසිද්ධියට පත්ව ඇත. මහජන මුදලින් සැලකිය යුතු කොටසක්, එනම්, දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 4%ක් පමණ නිදහස් අධ්‍යාපනයට සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා ආයෝජනය කිරීම හේතු කොට ගෙන ලෝකයේ දියුණුම රටවල් සමග කරට කර යමින් සාක්ෂරතාවය සහ සහජීවනය අතින් ඉහළ ස්ථානයක් දිනා ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. මීට අමතරව ශ්‍රී ලංකාව, සමෘද්ධි, පුබුදමු වෙල්ලස්ස, රජරට නවෝදය, දැයට සෙවණ, ගමට තාක්ෂණය, නැගෙනහිර නවෝදය ආදී වැඩසටහන් මගින් සහ තක්ෂණය ගෙනයෑම සඳහා විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම මගින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සහ එමගින් දුප්පත්-පොහොසත් භේදය අවම කිරීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා ඇත. සමාජයට උපකාර කෙරෙන මෙවැනි වැඩසටහන් ප්‍රවේශමින් අධීක්ෂණය කළ යුතු අතර එසේ උපකාර ලැබීමට යෝග්‍ය නමුදු කොන් කරනු ලැබ සිටින ජනතාව වෙත මෙම වැඩසටහන්වල ප්‍රතිලාභ ලැබෙන පරිදි ඒවා පුළුල් කළ යුතු අතර එමගින් ආර්ථික ක්‍රියාවලියේ ප්‍රධාන ධාරාවට ඔවුන්ව රැගෙන ඒම කළ යුතුය.

## ආහාර සුරක්ෂිතතාවය

ඔරොත්තු දිය හැකි මුදලකට ලබා ගත හැකි වන ලෙස ආහාර සුලබවීම ආහාර සුරක්ෂිතතාවය ලෙස හැඳින්විය හැකි අතර එය දුප්පත්කම හා බැඳුණු ඉතාමත් වැදගත් ප්‍රස්තුතයක් ලෙස පෙන්වා දිය හැක. කෘෂිකර්මාන්තය පිළිබඳ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණවලට ගෝලීය වශයෙන් අතිවිශාල ලෙස යෙදවුම් සිදු කළ ද දුප්පත් රටවල්වලට සහ දුප්පත් ජනතාවට මූලික ආහාර අවශ්‍යතා සපුරාගැනීමටවත් නොහැකි වන





තරමට 2008 වසරේදී ආහාර මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම සිදු විය.

ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ප්‍රථම වරට සාකච්ඡාවට බඳුන් කරනු ලැබුවේ 1996 වසරේ රෝමයේ පවත්වන ලද ආහාර සමුළුවේදීය. ඉන් අනතුරුව, අහස උසට ඉහළ ගිය ආහාර මිල නිසා බරපතළ අර්බුදයකට ලක් වූ රටවල්වලට ආධාර ලබා දිය යුතු යැයි ජාත්‍යන්තර ප්‍රජාව අවදි කිරීමට සමත් වූ පොදු සම්මුති ප්‍රකාශනයක් සකස් කළ ගෝලීය ආහාර අර්බුදය පිළිබඳ සමුළුව ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් 2008 වසරේ දී සංවිධානය කරනු ලැබිණි. ධනවත් රටවල්වලින් දියුණුවෙමින් පවතින රටවල්වලට ලබා දෙන්නා වූ කෘෂිකාර්මික සහනාධාර එම රටවල්වල ආහාර නිෂ්පාදනයට අනර්ථකාරී ලෙස බලපාන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් සිදු කරන ලද අධ්‍යයන මගින් දිගින් දිගටම පෙන්වා දෙන ලදී. කෘෂිකාර්මික සංවර්ධනයේ නිසි කළමනාකාරිත්වයක් නොමැති බවට අදාළ අධිකාරීනට දෝෂාරෝපණය කිරීම පහසු වන අතරම ග්‍රාමීය ගොවීන්ට ලැබිය යුතු සාධාරණ ප්‍රතිලාභ ගැන නොසිතා ස්වයංපෝෂණය දෙස පමණක් බැලීමේ දෘෂ්ටිය දුප්පත්කම වැඩි කර ආහාර අර්බුදය තීව්‍ර කරනු ලැබීය.

පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලදී 1960-1980 දක්වා කාල පරාසය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය වන 'සහල්' සඳහා මූලික අවධානය යොමු කරන ලදී. මෙම කාලය තුළ, තදබල ආර්ථික අර්බුදයක් සහිත වටපිටාවක් යටතේ, ඊට එදිරිව සහ මූලික ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සීමා කෙරුණු වාතාවරණයක් යටතේ ශ්‍රී ලාංකීය විද්‍යාත්මක ප්‍රජාව, විශේෂයෙන් ශාක අභිජනන විද්‍යාඥයින් විසින් එවකට හොඳම බෝග ලෙස මුළු දකුණු ආසියාවේම සැලකිල්ලට බඳුන්වූ ඉහළ අස්වැන්නක් ලබා දෙන වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය කරමින් ආහාර අර්බුදයට විශිෂ්ට ලෙස ප්‍රතිචාර දක්වන ලදී. නිදසුන් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද සමායෝජිත වී ප්‍රභේදකරණ පරීක්ෂණ (CMRT) මගින් 1952 දී හෙක්ටාරයකට මෙ. ටො. 1.5ක් වූ වී අස්වනු විභවය 1957 වන විට හෙක්ටයාරයකට මෙ. ටො. 2.5 දක්වා ද 1970-73 කාලය අතරතුර හෙක්ටයාරයකට මෙ. ටො. 7.0 දක්වා ද 1978 වන විට හෙක්ටයාරයකට මෙ. ටො. 10ක් ලබා ගත හැකි ඉහළම සීමාව දක්වා ද වැඩි දියුණු කරන ලදී. එසේම ජනගහනය මිලියන 7.0ක්ව පැවති 1950 ගණන්වල මුල් කාලයේ 45% ක්වූ ශ්‍රී ලංකාවේ සහල් ස්වයංපෝෂණ තත්වය ජනගහනය මිලියන 15ක් වූ 1980 වසර වන විට 95% දක්වා ඉහළ නැංවීමට සමත් විය. ශ්‍රී ලංකාව සාර්ථක ආහාර නිෂ්පාදන ප්‍රයත්නයක් අඛණ්ඩව පවත්වාගෙන යන බවක් පෙන්නුම් කරමින්, වඩා මෑතකදී ලබා ගත් දත්තවලට අනුව, 2003 වර්ෂයේ දී අවශ්‍යතාවයෙන් 97.10%ක්වූ දේශීය සහල් සැපයුම 2005 වන විට 100.97%ක් දක්වා ඉහළ නංවා තිබිණි.

මෑතක දී ගෝලීය ආහාර අර්බුදයට පෙර ශ්‍රී ලංකාව ආහාර නිෂ්පාදනයේ අනාගත අභියෝග සඳහා මුහුණ දීමට අවශ්‍ය කෙරෙන විද්‍යාත්මක අධ්‍යයන ආරම්භ කර තිබූ බව මෙහි දී සඳහන් කිරීම වටී. කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP) මගින් මූල්‍යාධාර සපයන ලදුව 1990 ගණන්වල අග භාගයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සහ බතලගොඩ වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ (RRDI) විද්‍යාඥයින් කණ්ඩායමක්

වී ප්‍රභේද වල නිෂ්පාදිතතාවය කෙරෙහි පරිමණ්ඩිත වායුගෝලීය උෂ්ණත්වය සහ කාබන්ඩයොක්සයිඩ් සාන්ද්‍රණය ඉහළ යෑමේ බලපෑම අධ්‍යයනය කිරීම ආරම්භ කරන ලදී. දේශගුණ විපර්යාස සමගින් ඇති විය හැකි යැයි සිතිය හැකි ලවණතාවයට ඔරොත්තු දීම ඇගැයීම සඳහා මෑතක දී ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) මගින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහයෝගය ඇතිව අලුතින් දියුණු කරන ලද බෝග ප්‍රභේද මෙන්ම සම්ප්‍රදායක වී ප්‍රභේද වන 'පච්චපෙරුමාල්' සහ 'දහනල' යනාදියෙහි අනුහුරුවීම පිළිබඳ අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනයන්ට අමතරව ''අපි වවමු-රට නගමු'' යන බහු ආංශික ක්‍රමෝපායයන් ඔස්සේ රජය ආහාර නිෂ්පාදන පරිශ්‍රමයට සක්‍රීයව දායක වී ඇත.

අත්‍යවශ්‍ය මූලික ආහාර සුරක්ෂිත සහ මනාව පරිකල්පනය කරන ලද ක්‍රමවේද පිළිබඳ විද්‍යාත්මක සොයාබැලීම්, අඩු ජල අවශ්‍යතා සහිත හෝ ජල හිඟයකට ප්‍රතිචාර දැක්විය හැකි බෝග ප්‍රභේද වැඩි දියුණු කිරීම, ගෝලීය ආහාර නිෂ්පාදනය පිළිබඳ පෙරදැක්මක් සහිත බුද්ධිමත් අධ්‍යයනයක් සිදු කිරීම සහ පූර්ව අනතුරු හැඟවීම් සිදු කරන ලද නුදුරේ දී ඇති විය හැකි අසංතුලන හෝ ආහාර හිඟය ව්‍යාප්තවීමේ ප්‍රවණතා, නොසිතා හෝ සිතාමතා හෝ ශාකවලට තර්ජනයක් වන පළිබෝධ, රෝග, ආක්‍රමණශීලී විශේෂ, ජානමය විකරණයකට ලක් කරන ලද ජීවීන්, රසායනික ද්‍රව්‍ය හෝ පාංශු වර්ධක ලෙස හඳුන්වනු ලබන කාරක යනාදිය හඳුන්වාදීම අනාවරණය කර ගැනීම සහ/ හෝ ඒවාට එරෙහිව ක්‍රියා කිරීම ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි එල්ලවන තර්ජනවලට පිළිතුරු දීම සඳහා වන පූර්ව අවශ්‍යතා ලෙස පෙන්වා දිය හැක. ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් කල්පවත්නා සම්ප්‍රදායක කර්මාන්තයන්ගෙන් එකක් වන පොල් කර්මාන්තය මෙරටින් අතුගා දැමීමට තරම් තර්ජනයක් වූ ආක්‍රමණයක් වන පිලිපීන පත්‍ර කණින්නා ***'ප්‍රොමෙකුතිකා කුමින්ගි' (Promecotica cumingi)*** මගින් 1970 ගණන්වල මුල් භාගයේ අනපේක්ෂිත ලෙස පොල් වගාවට ඇතිවූ මාරාන්තික විභවයක් සහිත හානිය හේතු කොට ගෙන නිර්මිත ජාතික අර්බුදය විසඳීමට විද්‍යාව හා තාක්‍ෂණය දායක වීම අනර්ඝ නිදර්ශනයක් ලෙස මෙහි දී පෙන්වා දිය හැක. එවකට පැවති ආණ්ඩුව පුළුල්ව පැතිරී ගිය මහජන උද්ඝෝෂණ මධ්‍යයේ වහාම ශාක නිරෝධායන නීතිවල පිහිට පැතූ අතර අර්බුදය විසඳීමට සහ පොල් කර්මාන්තය බේරා ගැනීමට මෙරට කීට විද්‍යාත්මක නිපුණතාවයෙහි මැදිහත්වීමක් බලාපොරොත්තු විය. ව්‍යසනාවකට මෙන් ප්‍රථම මතුවීමෙන් වසර 2ක් පමණක් ගතවූ කල්හි මෙම විද්‍යාඥයන් විසින් මනෝඥ ලෙස සකසා ක්‍රියාත්මක කරන ලද ජෛව විද්‍යාත්මක පාලන වැඩසටහනක් මගින් මෙකී හානිය පාලිත තත්ව යටතට පත් කරන ලදී. මෙම හානිය අනභිප්‍රේතව හෝ අභිප්‍රේතව හඳුන්වාදුන් විනාශකාරී පළිබෝධයක් නිසා සිදු වූයේ ද යන්න අභිරහසක්ව පවතී.

## බලශක්ති සුරක්ෂිතතාවය

ආහාර අර්බුදයට සමාන්තරව, විශාල වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොලෙහි බොරතෙල් මිල තීව්‍ර ලෙස ඉහළ යෑම නිසා අනපේක්ෂිත බලශක්ති අර්බුදයක් පැන නැගුණි. අත්‍යවශ්‍ය වූ ප්‍රවාහන අංශය නඩත්තු කිරීම සඳහා ශ්‍රී ලංකාවට ෆොසිල ඉන්ධන, මත යැපීමට සිදුවී ඇති නිසා මෙම අර්බුදය බේරුම් කර ගැනීම රජයේ බල සීමාවෙන් පිටත පවතින බව කිව යුතුය. ෆොසිල ඉන්ධන ජෛව ඉන්ධන මගින් ආදේශ කළ හැකි නමුදු කෘෂිකර්මාන්තයෙන් යැපෙන ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට එහි භූමි සම්පත්වල ආහාර නිෂ්පාදන හැකියාව ජෛව ඉන්ධන නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි යැයි බලාපොරොත්තු වීම නොසිතිය හැකි තරම්ය. අනෙක් අතට, 2007 දී කැණීම් කටයුතු ආරම්භ කරන ලද මන්නාරම් ද්‍රෝණියෙන් තෙල් ලබා ගැනීමට ශ්‍රී ලංකාව වාසනාවන්ත වුවහොත් අනාගතයෙහි අප රටට තෙල් අර්බුදයෙන් ගොඩ ඒමට හැකිවනු ඇත.

ශ්‍රී ලංකාව කෙසේ වෙතත් විද්‍යුත් බලශක්ති හිඟයකින් අතිශයින් පීඩාවට පත්වීමක් සිදුවීමට ඉඩ නොමැති තරම්ය. දශක දෙකක් තරම් කාලයක් තුළ පරිසරවේදීන් හා අනෙකුත් අවශ්‍යතා මත එම අංශයේ ක්‍රියාකාරීන් විසින් ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදෙන ලද වැදගත් බලශක්ති ජනන වැඩසටහන් දෙකක් වන ඉහළ කොත්මලේ ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය (150MW) සහ නොරොච්චෝලෙයි ගල් අඟුරු බලාගාරයේ පළමු අවධිය (300MW) වත්මන් රජයේ ප්‍රබල දේශපාලන තීන්දුවක් මත ක්‍රියාවට නංවා ඇත. මෙම ව්‍යාපෘති දෙක හැරුණු කොට කෙරවලපිටියේ ඒකාබද්ධ චක්‍ර බලාගාරය (300MW) සහ කුඩා මෙන්ම ක්‍ෂුද්‍ර ජල විදුලි බලාගාර බොහෝමයක් මෙන්ම (දර (ශාක), සූර්යාලෝකය, සුළඟ, තරංග ශක්තිය ආදී) පුනර්ජනනීය ප්‍රභව යොදා ගන්නා කුඩා බලශක්ති ජනන ඒකක ශ්‍රී ලංකාවේ බලශක්ති හිඟය අවම කිරීමට උපකාර කර ගත හැකි වනු ඇත.

## සෞඛ්‍ය සත්කාර පිළිබඳ සුරක්ෂිතතාවය

ගෝලීය වශයෙන් බැලූවද ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සත්කාර පිළිබඳ සුරක්ෂිතතාවය අත්‍යවශ්‍යයෙන්ම මනා කළමනාකරණයකින් යුක්ත බව පිළිගැනේ. දකුණු, ගිනිකොණදිග සහ නැගෙනහිර වෙරළබඩ කලාපවල මිරිදිය ප්‍රභව පුළුල් ලෙස දූෂණයට ලක්වූ ඉන්දීය සාගර සුනාමියෙහි විපාක ලෙස වාහකයින් මගින් සහ ජලය මගින් හට ගන්නා විනාශකාරී රෝග වසංගත පැතිරයාම වැළැක්වීම සඳහා සෞඛ්‍ය අංශය මගින් දක්වන ලද ප්‍රතිචාරය මේ බව මැත අතීතයේ දී හොඳින්ම පෙන්වා දෙනු ලැබිණ. එමෙන්ම සමහර දියුණු රටවල්වලට සමාන කළ හැකි තත්වයක පවතින, ළමා මරණ සහ මාතෘ මරණ අනුපාත අඩු වීමේ විශිෂ්ට ප්‍රගතියක් සහිත අඩු ආදායම් ලබන රටකට නිදසුනක් ලෙස ශ්‍රී ලංකාව පුළුල් ලෙස ලොව පුරා ප්‍රචාරයට

ලක්වී ඇත. UNAIDS වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාව ‘පහළ මට්ටමේ එච්. අයි. වී. වසංගත’ සහිත රටක් ලෙස ද වර්ග කර ඇති අතර මෙම සියලුම අංග මගින් ශ්‍රී ලංකාව වසර 2015 වන විට සහස්‍ර සංවර්ධන ඉලක්ක (MDG) සපුරාගැනීමේ නිසි මාර්ගයට පැමිණ ඇති බව වාර්තාවේ. කෙසේ වෙතත්, උතුරු මැද පළාතේ දැනට පවතින්නාවූ තවමත් නියමාකාර ප්‍රතිකාරයක් සොයා නොගත් පරිසරය ආශ්‍රිත ව්‍යසනයක් වන වකුගඩු ආබාධ සහිත රෝගීන්ගේ සංඛ්‍යාව ඉහළ යාම වැනි තත්වයන් ගැඹුරින් සලකා බැලිය යුතු අතර බහුවිෂයික විමර්ශනයක් මගින් මෙම ගැටළුව විසඳීම සඳහා වේගවත් පියවර ගත යුතුව ඇත.

## කාලගුණය හා සම්බන්ධිත ව්‍යසන සහ ජාතික ආරක්ෂාව

මෑත කාලයේදී ස්වභාවික මෙන්ම මිනිසා මගින් ඇති කෙරෙන කාලගුණය හා සම්බන්ධ ව්‍යසන මගින් ජාතික ආරක්ෂාවට නිරන්තරයෙන්ම තර්ජනවලට ලක්වන්නට ශ්‍රී ලංකාවට සිදු විය. මේ අතරින් අප රට මේතාක් මුහුණ දුන් විනාශකාරී ස්වභාවික ව්‍යසනය වන්නේ 2004 දෙසැම්බරයේදී අත්දුටු අනපේක්ෂිත සුනාමියයි. මෑත කාලීන විචාරකයන්ගේ විෂය වූයේ මෙවැනි ව්‍යසන සිදුවීම්වලින් ජාතික ආරක්ෂාව සකසා ගන්නේ කෙසේද යන්නයි. තත්‍ය කාලීන විපරම්කිරීම් මගින් තොරතුරු සැපයීම සඳහා අවශ්‍ය කරන නූතන උපකරණවලින් සමන්විත කරන ලද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මෙවැනි කාලගුණය හා සම්බන්ධව පූර්ව අනතුරු හැඟවීමේ වගකීම පැවරී ඇත. අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සහ සුනාමි අවස්ථා පිළිබඳ දත්ත සැකසීමේ සහ මොඩල සෑදීමේ විද්වත් දැනුම සමග භූ කම්පන සහ තත්‍ය කාල මුහුදු මට්ටම් අධීක්ෂණ ජාල පිහිටුවීම මිල අධික වන අතර ඒ සඳහා කාලය ද අවශ්‍ය වේ.



කෙසේ වෙතත්, මෙම අවශ්‍යතාවයන්හි බලවත් ඕනෑකම සැලකිල්ලට ගෙන හවායි සහ ටෝකියෝවල පිහිටුවා ඇති සුනාමි අනතුරු හැඟවීමේ මධ්‍යස්ථාන, සුනාමි අනතුරු හැඟවීමේ අතුරු මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති ශ්‍රී ලංකාවේ කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුවට ඉන්දීය සාගර සුනාමි උපදේශන සේවාවක් සැපයීම පිළිබඳ එකඟතාවය පළකර ඇත.

මේ අතර 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ ප්‍රඥප්තියත් සමග ව්‍යසන කළමනාකරණය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ජාතික සභාව උපදේශන කටයුතු සපයන ඒකකය ලෙසද ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) ප්‍රධාන මෙහෙයුම් නියෝජිත ආයතනය ලෙසද පිහිටුවා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ගෞරව බහුමානයෙන් සලකනු ලබනු ඇතැයි සැලකෙන, සෑම ආකාරයකම ව්‍යසන සම්බන්ධව අවදානම අඩුකිරීම සඳහා සමාන මෙන්ම පුළුල්ව පිළිගත් රාමුවක් සහතික කිරීමට ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ජාතික ව්‍යසන කළමනාකරණ ප්‍රතිපත්තිය දැනටමත් කෙටුම්පත් කරනු ලැබ ඇත.

## විකිරණවේදය සහ න්‍යෂ්ටික අනතුරු තර්ජන

ඕනෑම ආකාරයක විකිරණවිද්‍යාත්මක හදිසි අවස්ථාවන්ට සහ අසල්වැසි රටක සිදු විය හැකි න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක හදිසි අනතුරු බලපෑම්වලට ඵලදායී වේගවත් ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් ඇති කිරීමට ව්‍යසන කළමනාකරණ පනත මගින් පරමාණුක බලශක්ති අධිකාරියට (AEA) බලය පවරා ඇත. ව්‍යසන කළමනාකරණ සහ මානව හිමිකම් පිළිබඳ අමාත්‍යාංශය මගින් 2005 දී සකස්කරන ලද ව්‍යසන අවදානම කළමනාකරණය සඳහා වන මාර්ගෝපදේශවලට ජාතික විකිරණවිද්‍යාත්මක සහ න්‍යෂ්ටික හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්මක් අන්තර්ගත කොට ඇත. මේ අතර න්‍යෂ්ටිකමය හදිසි අනතුරු සඳහා, සහ පාරිසරික විකිරණ අධීක්ෂණය කිරීම සඳහා තාක්ෂණ සහයෝගිතා වැඩසටහනක් මගින් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරිය ශ්‍රී ලංකාවේ පරමාණුක බලශක්ති අධිකාරියට අවශ්‍ය කෙරෙන සහයෝගය ලබා දේ. වසර 2011දී නිම කිරීමට නියමිත මෙම වැඩසටහනට, (අ) පාදරේඛා පාරිසරික විකරණශීලතා මට්ටම් සැකසීම සඳහා අවශ්‍ය කෙරෙන ශක්‍යතාවය වැඩිදියුණු කිරීම, (ආ) මාර්ගගත විකිරණ අධීක්ෂණය සම්බන්ධයෙන් වන පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතියක් පිහිටුවීම, සහ (ඇ) ආරක්ෂාකරී ක්‍රියාවල මැදිහත්වීමේ මට්ටම තීරණය කිරීම පිණිස මුල්කෙටුම්පත් සැකසීම යනාදිය ඇතුළත්වේ. මෙම වැඩසටහන ප්‍රාරම්භක වශයෙන් දකුණු පළාතේ මෙන්ම යාපනය, මන්නාරම,

ත්‍රිකුණාමලය සහ කොළඹ යන දිස්ත්‍රික්ක ආවරණය කරමින් ක්‍රියාත්මක වෙනු ඇත.

## භීෂණය, අපරාධ සහ ජාතික ආරක්‍ෂාව

මෑත කලය තුළ වඩාත් සාකච්ජාවට බඳුන් වූ කරුණක් ලෙස භීෂණයෙන් සහ අපරාධවලින් ආරක්ෂාව සපයා ගැනීම යන්න පෙන්වා දිය හැක. වසර 2005 සහ 2006 යන කාලවලදී එක් වසරකට අපරාධ 60,000ක් බැගින් වාර්තා වී ඇති අතර ඉන් නඩු තුනෙන් එකක් (1/3) සඳහා වන චූදිතයන් තවමත් සිරභාරයට ගෙන නොමැත. නඩුවලින් 60%ක් විසඳීමට ඉතිරිව ඇති අතර විනිශ්චයකින් පසු වැරදිකරුවන් සඳහා දඬුවම් කර ඇත්තේ නඩු 3.6%ක් සඳහා පමණි. මෙය රටේ මහජන ආරක්‍ෂාව, නීතිය සහ සාමය පිළිබඳ බරපතල චෝදනාවක් වන අතර මේ නිසාම අධිකරණ වෛද්‍ය විද්‍යාව මගින් ලබාගත් සාක්ෂි මත පදනම් වූ නීති බලගැන්වීමේ පද්ධතියක අවශ්‍යතාවය අවධාරණය කළ යුතුය.

මෙම සන්දර්භය තුළ ආරක්‍ෂක, මහජන ආරක්‍ෂාව, නීතිය, සහ සාමය පිළිබඳ ආමාත්‍යාංශය මගින් ජංගම දුරකථන සහ ගුවන් විදුලි, විදුලි සංදේශ පද්ධති භාවිතයෙන් රට පුරා සන්නිවේදන කටයුතු සහ තොරතුරු බෙදාහැරීමේ පහසුකම් සැපයීමට ක්‍රියා කර ඇත. මහජනතාව වෙත සපයා ඇති මෙම පහසුකම මගින් විශේෂයෙන් අපරාධ සහ අනෙකුත් හදිසි අවස්ථා පිළිබඳ පණිවුඩ දිවයිනේ සෑම පොලිස් ස්ථානයකටම එකම විට සම්ප්‍රේෂණය කළ හැකි වන අතර එමගින් ඉහත කී අවස්ථා සඳහා කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලැබී තිබේ.

## සමූල ඝාතක අවිආයුධ භාවිතයෙන් ඇති කෙරෙන තර්ජන

ශ්‍රී ලංකාව සැලකූ විට මෙතෙක් න්‍යෂ්ටික 'රසායනික' සහ ජෛව විද්‍යාත්මක සම්භවයක් සහිත සමූලඝාතක අවි මගින් බරපතළ ප්‍රහාරයකට ලක්වීමට සිදු නොවුනද විශේෂයෙන් බුද්ධිමය තොරතුරු එකතු කිරීම සහ විශ්ලේෂණය සඳහා ජාත්‍යන්තර සහයෝගිතාවය සහ උපදෙස් සහිතව එවැනි භයානක අවි පිළිබඳ සුපරික්ෂාකාරීව සිටීමේ දැඩි අවශ්‍යතාවයක් මෙකල පැන නැගී ඇත. න්‍යෂ්ටික, රසායනික, සහ ජෛව විද්‍යාත්මක අවි පිළිබඳ පුද්ගලයන් පුහුණු කිරීමට සකසා ඇති රසායනික අවි පිළිබඳ සම්මුතිය යටතේ රසායනික අවි තහනම් කිරීමේ ආයතන සමග ශ්‍රී ලංකාව දැනටමත් සබඳතා ගොඩනගාගෙන ඇත. අපරාධ, භීෂණය, සහ විනාශකාරී ආයුධ භාවිතය යනාදියෙන් මහජන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවකාශයික සහ කාලික විෂයපථයක් මත සපයනු ලබන්නාවූ තොරතුරු 'ජාතික තොරතුරු බෙදාගැනීමේ රාමුවක්' මගින් ජාතික මට්ටමේ තොරතුරු හුවමාරු කර ගැනීමේ සහ බෙදාහැරීමේ තදබල අවශ්‍යතාවයක් පවතින බව පෙන්වා දී තිබේ. මූලික අධිකරණ වෛද්‍ය විද්‍යාත්මක සහ අපරාධ දත්තවලට සම්බන්ධ තොරතුරු සඳහා අප්‍රමාදී නිෂ්කාශනයක් සහතික කිරීම තවත් අවශ්‍යතාවයකි. එක් පැත්තකින් රජය, ආරක්ෂාව, පර්යේෂණ සහ අදාළ ආයතනද අනෙක් පසින් දත්ත වර්ගීකරණය, ආරක්ෂක විගණනය කිරීම්, තොරතුරු පරිපාලනය කිරීමද සම්බන්ධකරමින් 'ජාතික තොරතුරු සුපිරි මං පෙතක්' ඔස්සේ තොරතුරු හුවමාරු කර ගැනීමේ මුල් කෙටුම්පතක්/ආකෘතියක් ආවරණය කරමින් ප්‍රතිපත්ති රාමුවක් සැකසිය යුතු බවට යෝජනාවක් ඉදිරිපත් වී ඇත. මෙලෙස සැකසූ තොරතුරු පද්ධතියක් අදාළ තොරතුරුවල අනුකූලතාවය සහ එමගින් ජාතික ආරක්ෂාව අපහසුතාවයකට පත් නොකෙරෙන බව සහතික කිරීම පිණිස මස්තක මණ්ඩලයක අධීක්‍ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය.

## දේශසීමා උල්ලංඝනය සහ ජාතික ආරක්‍ෂාව

අවසාන වශයෙන් ශ්‍රී ලංකාව කුඩා දූපතක් වීම නිසා දේශසීමා උල්ලංඝනය කිරීමේ තර්ජනයට ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳ දැනුවත් විය යුතු අතර ඒ හා සම්බන්ධව මනා අවධානයකින් සිටිය යුතු වේ. එක්සත් ජාතීන් විසින් සිදුකළ අධ්‍යයනයකින් වාර්තාවන අන්දමට ඖෂධ ජාවාරම්කරුවන්ගේ ජාත්‍යන්තර ජාල, විවිධ රටවල්වල හිටපු සංවිධානාත්මක හොරකල්ලි සහ හිටපු බුද්ධි අංශ නිලධාරීන් විසින් ජාත්‍යයන්තර මූල්‍ය පද්ධති මාර්ගයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ඇස්තමේන්තු කර ඇති පරිදි ගෝලීය ආර්ථිකයෙන් 5%ක් පමණ සොරාග න්නා ජාතික මායිම් ඉක්මවූ සංවිධිත අපරාධ ලෝකයේ වැඩිම වේගයකින් වර්ධනය වන කර්මාන්තය වීමට ඉඩ ඇත. මෙම අභියෝගයට මුහුණ දීම සඳහා ජාතික මායිම් ඉක්මවූ සංවිධිත අපරාධවලට එදිරිව එක්සත් ජාතීන්ගේ සම්මුතියක් රටවල් 140 ක් මගින් වාර්තාගත වන කාලයක් තුළ දැනටමත් අත්සන් තබා ඇති අතර දේශසීමා උල්ලංඝනය කිරීම පිළිබඳව සුපරික්ෂාකාරී වීමේ සහ ඉහත කී සම්මුතියෙහි විධිවිධානවලට අනුව එහි උපකාර ලබාගැනීම සහ මගපෙන්වීම යටතේ කටයුතු කිරීම සිදුකළ යුතුවේ.



***එම්. අසෝක ටී. ද සිල්වා***
***හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්***
***ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය***
***කොළඹ***